



# ඔබ ඇපල් මලක් වාගේ

ඔබ ඇපල් මලක් වාගේ
ලස්සන වසන්ත කාලේ
මට හදිස්සියෙන් වාගේ හමු වූ
පායන්න දැස මානේ උණුහුමට ගින්දරී
ගෙනියන්න මාගේ ගානේ මේ හිතම සුන්දරී
දිගු දෑසේ බැල්ම ඔබගේ ඇයි සොඳුරු ඔය හැටී?

ඇස් පියෙන් අදී කැලි කැපෙන රළු රාත්‍රියේ
කීරි ගැහෙන හිත අනුහස අයැදියි ප්‍රේමයේ
එය පමණක් ශේෂය වී නම් පූර්වාත්මයේ
ඔබ ගැවසෙන මා හිත අවිවේකයි
අවනත නැති විට හිත අවිවේකයි
හුදෙකලාව අවනඩුවකි - ගෑණු ළමයෝ.....

ඉටි රූපෙ අපූරුව විඳින්න මං හරි ආසයි
පින්තූරේ වගේ ඔබ හිනැහෙන කොට මට ලෝබයි
අහිතක් හිතන්නේ නැතිනම්, මං හරි ආදරෙයි
කියාගන්න බැරිකමින් හිත බරයි
ඊයේ, අද මෙන් හෙටත් එහේම වෙයි.
හුදෙකලාව අවනඩුවකි - ගෑණු ළමයෝ....

*ගායනය:* විශාරද අමරසිරි පීරිස්
*තනුව සහ සංගීතය:* සංගීත් වික්‍රමසිංහ
*රචනය:* කැළුම් ශ්‍රීමාල්



අපි නිරතුරුවම ප්‍රේමය, ප්‍රේම ගීත පිළිබඳව කතා කරන්නෙමු; රස විඳින්නෙමු; ලියන්නෙමු. ඒ තරමට ම ආදර ගීත නිර්මාණය වෙන නිසාවෙනි, ඒ. එහෙත් ඒ අතරට එක්වන අපූර්වත්වයෙන් යුත් ගීත කෙතරම් සීමිත ද?

ගීතයත් යනු පද රචනයක සාහිත්‍යයෙනුත්, තනුවක හා වාදනවල මියැසියකිනුත්, කටහඬක මධුරත්වයෙනුත් සුසැදි පළයකි. එසේනම් අපූරු ගීයක් වීමට නම් යට කී තෙවැදෑරුම් කාරණාත් අපූර්වත්වයෙන් අනූන විය යුතුයි. මේ පූර්විකාව ලියා පෙරට ගෙන එන්නේ එවන් අපූරු ගීයක්. ''ඔබ ඇපල් මලක් වාගේ'' කිව් සැනින් කා හටත් සිහිපත් වන රසික සිත් සතන්වල අපූරු මතකයක් ඉතිරි කළ ගීයක්.

පද රචනයේ මුල් වදන් කීපයෙන් ම, රචකයාණන් රසිකයා කැඳවාගෙන යන්නේ අපූර්වත්වයකට නොවේද? කිසිදා ඇපල් මලක් හෝ ගසක්වත් නො දුටු රසිකයින් පවා යම් මනෝමය සුන්දරත්වයක නහවන්නට රචකයාණන් සමත්. ලස්සන වසන්ත කාලයක හමු වූ ඇය ඔහුට 'ඇපල් මලක්' වාගෙයි. ඔහුට ඇය හමුවෙන්නේ හදිස්සියෙන් වාගේ; අහම්බයෙන්. පද රචනයට බස් වහරේ යෙදුම් එක් වන සැටියයි ඒ. තමන්ගේ දෑසට පේන තෙක් මානයේ පෙනී සිටින්නට ඇයට ඔහු ඇරයුම් කරන්නේ ඒ දසුන පවා තමන්ට උණුසුම් සිතුවිලි ගෙන එන නිසා. උණුසුම් සිතුවිලි ඔහුට ගෙන එන ඇය ඔහු අමතන්නේ 'ගින්දරී' නමින්. ගින්දරක් මෙන් පෙණුමෙන් පවා උණුසුම ගෙන එන ආකර්ශණීය ඇයට ඔහු පට බඳින නමයි 'ගින්දරී'. ඊත් ඇයට ගෙනියන්න ඔහු ගානේ දෙන්න තියෙන්නේ ඔහුගේ හිත පමණක් ම යි. මේ සුන්දරියගේ දිගු දෑසේ බැල්ම ඔය තරමට ම සොඳුරු කිමදැ යි ඔහුට සිතා ගන්නට බෑ. 'ඔය හැටී' වදන් ඔහු ට එක් වන්නේ බස් වහරින්.

''කෑලි කපන්නට පුළුවන් තරම් අඳුරු'' රැයවල් ගැන කියැවෙන්නේ අපි කතා කරන බස් වහරේ. ඒ වාගේ රාත්‍රී කාලයේ පවා ඔහුගේ ඇස් පියෙන් අදින්නේ ඇයගේ රුව දකිනා සිතයි. ඒ ආදරණීය ප්‍රේමයේ අනුහස කීරි ගැසී ඇති ඔහුගේ සිත අයැදියි. පූර්ව ආත්මයක පටන් ඉතිරිව ඇත්තේ සිත අයැදින ඒ අනුහසයි. ඔහුගේ සිතේ ගැවසෙන්නේ ම ඇයයි. ඉතින් ඒ අවනත නැති සිත අවිවේකයි, සැම විටෙක ම. ඊත්, ඔහු තවමත් හුදෙකලාවයි කල් ගෙවන්නේ. මේ තනිකම නම් ''අවනඩුවක්'' ම යි ඔහුට. ඔහු මහත් වීරියෙන් ඇයට මේ බව කියා පාන්නේ ඇයට ''ගෑණු ළමයෝ'' ලෙසින් අමතමින්. ''ගෑණු ළමයෝ'' ''අවනඩුව'' වැනි වදන් අප ගීයකින් අසන්නේ මුල් වතාවට නොවේ දැ යි සිතෙයි.

''ඉටි රූපයක්'' වැනි ඇයගේ රූ සිරි විඳින්න ඔහු ''හරි ආසා'' බව පවසන්නේ අව්‍යාජව; හෘදයාංගවම. පින්තූරයක් වගේ හිනාවෙන ඇයගේ මුව මඩල දකිනා විට ඔහුට ඇති වෙන්නේ ලෝබකමක්. මේ සිනහා තමන්ගෙන් දුරස් වී යයි ද?''

''අහිතක් හිතන්න එපා, මං හරි ආදරෙයි..'' ඔහු සිතින් ඇයට කියා පාන්නේ ඉතාමත් ම අහිංසක ලෙසට. ඊත් ඔහුට එය සෘජුවම ඇයට කියාගන්න නො හැකි වීම හිතට බරක්. ඒ හිතේ බර ඊයේ, අද වගේ ම හෙටත් ඒ විදියටම පවතියි. මේ හුදකලාව නම් අවනඩුවක් මයි. ඔහු තමන්ගේ හිත බැඳගත් ගෑණු ළමයාට නැවතත් මුර ගායි.

ඒ ය, ගී පද රචනාවේ අපූර්වත්වය. මේ අපූර්වත්වයම අනන්‍යතාවය කොට ගෙන හෙළ ගී කෙතට පහළ වුණු අපූරු ගී පදනිබන්ධකයෙකි, කැළුම් ශ්‍රීමාල් මාධ්‍යවේදියාණන්. ඒ නිසා ම ක්ෂේත්‍රයේ දිගු ගමනක් පැමිණි කැළුම් ශ්‍රීමාල් නිබන්ධකයාණන්ගේ මේ නැවුම් වදන් මෙන් ම යෙදුම් අනෙකුත් ගී නිර්මාණ අතරේ මේ පදර රචනා කැපී පෙනීමට මුල් වුණ හේතුවක්. පොත පතේ ලියැවෙන වදන් හා යෙදුම් අතරේ බස් වහරේ වදන් හා යෙදුම් ගවසාලන්නට කැළුම් ශ්‍රීමල් නිබන්ධකයාණන් සමත් වෙන්නේ කිසිදු ආගන්තුක බවක් නො දැනෙන් පරිද්දෙන්.

නිහඬතාවයට විශේෂ අවධානයක් යොමු කරමින් නිර්මාණය වූ තනුවත්, සංගීතයත් වෙන ම රිද්ම රටාවකට ඉදිරියට ගෙනියන්නට බටහිර තාල වාද්‍ය කට්ටලයත්, රිදම් ගිටාර් රිද්මයත් සමත් වෙයි. පූර්ව සංගීතයේදීත්, අතුරු සංගීතයේදීත් නිහඬ බවට මුල් තැන දෙමින්, සෙමෙන් මතුවන රිද්ම රටාවට දෙවනුව වාද්‍ය භාණ්ඩ එක්වෙයි. මුල් අතුරු සංගීතයේ දී මුල් තැන් ගන්නේ ඒකල වයලීන වාදනයක්. ඊට ඉඳුරාම වෙනස් දෙවන අන්තර් වාදනය සරසන්නේ ඒකල බටනලා හඬත් සහ දෙවනුව එක්වන සර පුවරු නාද රටා.

මේ විශාරද අමරසිරි පීරිස් ගායනවේදියාණන්ගේ ගීයක් බව වෙසෙසින් සටහන් කළ යුතු නොවෙයි. සිය ගැඹුරු හඬත්, දාර්ශනික ගායනවේදයත් මෙවන් අපූරු නිර්මාණයකට මුසු කරවන්නේ ගීයේ තනුව සහ සංගීතය නිර්මාණය කළ සංගීත් වික්‍රමසිංහ ප්‍රවීණ සංගීතවේදියාණන්ගේ සිතැඟි මනා සේ ඉටු කරමින්. සංගීත් වික්‍රමසිංහයන් කවදත් අත්හදා බැලීම් කිරීමට උනන්දු වෙන ප්‍රවීණ වාද්‍ය ශිල්පියෙක්. ඒ අනුව යමින් තනුවට අනුගත වන විශාරද අමරසිරි පීරිසුන් තමන්ගේ සිතැඟින්වන්ද මුසු කරමින් ගීය අවසන් කරන්නේ උත්තර භාරතීය රාගධාරී සංගීතයේ හඬ රුවැ'ති ආලාප ගායනයකින්. අමරසිරි පීරිස් ගායනවේදියාණන් ගායනයෙන් ගීයට අපූර්වත්වය මුසු කළ සැටියයි, ඒ.



සිසිර දිසානායක